ප්‍රකාශ කළ අදහස්වල ලිඛිත පිටපත

**තානාපති කේෂාප්**
**ජෙට්වින් හෝටලය, යාපනය**

**අගෝස්තු 15,2016**

මෙවැනි අති මනෝහර සැන්දෑවක මෙම අලංකාර පියස මත අප හමුවීමට පැමිණීම ගැන ඔබ සැමට ඉතාමත් ස්තුතියි. මම සූදානම් කර ගෙන පැමිණි අදහස් ටිකක් ප්‍රකාශ කිරීමට අවසරයි.

මගේ වචන උච්චාරණය එතරම් නිවැරදි නොවූවත් මා පළමුවෙන් ම කියා සිටින්නේ *වනක්කම්* යන්න යි. දෙවෙනුව මට කීමට අවශ්‍ය වැදගත් දේ වන්නේ *ආයුබෝවන්* යන්නයි. මට කීමට අවශ්‍ය තුන්වැනි දේ වන්නේ *අසෙලාම අලේකුම්* යන්නයි. මගේ හදවතින්ම සුබ සැන්දෑවක් පතමින් ඔබ සියලු දෙනාට ම මගේ ආචාරය පුද කරමි.

මගේ විශිෂ්ට හා උගත් මිත්‍රයා වන ගරු විපක්ෂ නායක සම්බන්ධන් මහතා අද මෙහි පැමිණ සිටීම ගැන මම ඉතා කෘතඥ වන අතර එය ගෞරවයක් ලෙස ද සලකමි. උතුරු පළාත් සභාවේ මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් මෙන් ම මුළු දේශපාලන පරාසය ම නියෝජන කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද මෙහි සිටිති. ඔබ සැමට මෙහි පැමිණ සිටින කොළඹ ඇමරිකන් තානාපති කාර්යාලයේ නිලධාරීන් පමණක් නොව හොනලුලු, හවායි, ලාස් වේගාස්, නෙවාඩා, කැලිෆෝනියා හා වෙනත් බොහෝ ප්‍රදේශවලින් පැමිණ සිටින එක්සත් ජනපද පැසිෆික් සේනාංකයේ නිලධාරීන් ද හමු විය හැකියි.

මෙහි සිට යාපනය නගරයේ දේවස්ථාන, කෝවිල් හා අසල ඇති මුහුද ආදියේ සුන්දරත්වය නරඹමින් එක්සත් ජනපදයේ ජනතාවත් ශ්‍රී ලංකාවේ ජනතාවත් අතර ඇති චිරස්ථායී බැඳීම් අනුස්මරණය කිරීම ඉතා ආනන්ද ජනක කටයුත්තකි. මිත්‍රවරුනි, දීර්ඝ කාලීන ව සේවයක් සැපයූ අධ්‍යාපනික ආයතන පිහිටුවීමට ඇමෙරිකානු මිෂනාරිවරුන් මෙහි පැමිණියේ 1813 වර්ෂයේ දි බැවින් යාපනේ ජනතාවත්, ඇමෙරිකන් ජනතාවත් අතර සබඳතාව අවුරුදු දෙසීයකටත් වඩා ඈතට යන බව දැන ගැනීම මගේ සතුටට මෙන් ම ආඩම්බරයට ද හේතු වේ.

මම කීප වතාවක් ම යාපනයට පැමිණ ඇති අතර අවුරුදු ගණනාවක යුද සමය තුළ උතුරු පළාතේ ජනතාවට විඳිමට සිදු වූ දුක් වේදනා පිළිබඳ ව අසා ඇත්තෙමි. සත්‍යය සොයා ගැනීම, ප්‍රතිසන්ධානය හා වගවීම අත්‍යවශ්‍ය නමුත් මේ කිසිවක් නැති වූ හා විනාශ වූ ජීවිත ආපසු ලබා දෙන්නේ නැත. කෙසේ වෙතත් අතීතය අමතක නො කරමින් අනාගතයට අවධානය යොමු කළ හැකි මහඟු අවස්ථාවක් මෙම දිවයිනට දැන් ලැබී තිබේ. මෙම උත්සවය, අපේ ජනතාවන් අතර ඇති බැඳීම් වැරගැන්වීමටත්, යුද්ධයේ වේදනා සමනය කරමින් අර්ථවත් ජාතික ප්‍රතිසන්ධාන මාවතේ පිය නගන විට රටේ සෑම ප්‍රදේශයක සිටින ශ්‍රී ලාංකිකයන් හා සම්බන්ධ වීමට එක්සත් ජනපද රජය හා තානාපති කාර්යාලය ගන්නා උත්සාහය සිහිපත් කිරීමටත් අවස්ථාවක් වෙයි.

අද උදෑසන එක්සත් ජනපද පැසිෆික් සේනාංකයේ 'පැසිෆික් ඒන්ජල්' වැඩ සටහන ආරම්භ කිරීමට ගරු විපක්ෂ නායක ආර් සම්බන්ධන් මහතාත් මනෝ ගනේෂන් ඇමතිතුමාත් ගරු මහ ඇමති විග්නේෂ්වරන් මහතාත් සහභාගී වූහ. පළාත පුරා ස්ථාන ගණනාවක අවශ්‍ය සෞඛ්‍ය සේවා සැපයීමටත්, පාසල් හා පුස්තකාල ප්‍රතිසංස්කරණය කිරීමටත් එක්සත් ජනපද හමුදාවේ වෛද්‍යවරු මෙන් ම ඉන්ජිනේරුවන් විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලාංකික සගයන්ට සහාය වූයේය. අද උදෑසන ඉඩෛයිකඩු පාසලට යෑමට මට අවස්ථාවක් ලැබුණු අතර ශ්‍රී ලාංකික හා ඇමෙරිකානු හමුදා භටයන් මාල දිවයිනේ, නේපාලයේ හා බංගලාදේශයේ සගයන් සමග එක් වී අවශ්‍ය අයට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට සිවිල් වෛද්‍යවරුන් හා ස්වේච්ඡා සේවකයන්ට සහාය වන ආකාරය මම දුටුවෙමි. අප එකතු වී වැඩ කළ හොත් කොපමණ දේ ඉටු කළ හැකි දැයි මට නැවතත් සිහි විය.

නෝනාවරුනි, මහත්වරුනි, වඩාත් සමාන, වඩාත් සාධාරණ, වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී. වඩාත් විවෘත හා වඩා සෞභාග්‍යාවත් සමාජයක් හා රටක් ගොඩ නැගීමට ශ්‍රී ලාංකික ජනතාව 2015 වර්ෂයේ දී දෙවරක් ම ඡන්දය දී තිබේ. ජාතිය හා ආගම කුමක් වුවත් නීතිය ඉදිරියේ සියලු දෙනාට ම සමාන අයිතිවාසිකම් හා සමාන සැලකිලි ලැබෙන බව සහතික කරන මෙන් ම ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති සකස් කරන ලෙසට ඔබ සියලු දෙනා එක් වී ඔබේ නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටියෝ ය. ගතවූ මාස 19 තුළ ශ්‍රී ලංකාව නැවතත් විවේචනාත්මක විවාද, නිදහස් මාධ්‍ය හා ස්වාධීන සිවිල් සමාජ ආදියෙන් සමන්විත සාඩම්බර සාම්ප්‍රදායට නැවත පැමිණ තිබේ. මේ රටේ සියල්ලන්ට ම අදාළ හා වඩාත් නියෝජන සමාජ ගිවිසුමක් කෙටුම්පතක් සකස් කිරීම සඳහා පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර තිබේ.

මෙම ආරම්භක ධනාත්මක පියවර තබා ඇති නමුත් වාර්ගික විවිධත්වයෙන් යුත් පශ්චාත් ගැටුම් සමාජයකට දීර්ඝ කාලීන සාමය උදා කර ගත් රටක් ලෙස ගෝලීය ආදර්ශයක් වීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව සාක්ෂාත් කර ගැනීමට තව බොහෝ දේ කළ යුතුව තිබේ. පසුගිය වර්ෂයේ ජිනීවා නුවර දී ප්‍රතිසන්ධානය හා වගවීම සම්බන්ධයෙන් ලබා දුන් පොරොන්දු ඉටු කිරීමෙහි ලා ශ්‍රී ලංකා රජයේ ප්‍රගතිය, තව මාස අටක දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් විසින් වාර්තා කරනු ඇත. ජිනීවා නුවර දී ලබා දුන් පොරොන්දු ඉටු කිරීමට රජය දරන උත්සාහයට අපි සහාය පළ කරමු. අවශ්‍ය ආධාර ද ලබා දෙමු. මෙය දුෂ්කර නමුත් අත්‍යවශ්‍ය කටයුත්තකි. එය සියලු ශ්‍රී ලාංකිකයන්ගේ යහපතටත් සතුටටත් හේතු වනු ඇත.

අතුරුදහන්වූවන්ගේ පවුල් වලට එම පුද්ගලයන් නැති බවට සහතික නිකුත් කිරීමට ගත් තීරණයත්, අභ්‍යන්තර ව අවතැන් වූ පුද්ගලයන්ට ඉඩම් ආපසු ලබා දීමට ගත් තීරණයත් රජය විසින් ගත් ධනාත්මක පියවර ලෙස අපි දකිමු. අතුරුදහන් වූ පුද්ගලයන් ගැන දුක් වන හා ඔවුන් ගැන තොරතුරු සොයන පවුල්වලට සහාය වීමට අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීමේ නීතිය සම්මත කර ගැනීම අපේ ප්‍රශංසාවට හේතු වේ. යුද අපරාධ ගැන විමර්ශනය කිරීමට ප්‍රතිසන්ධාන, සත්‍ය සෙවීමේ හා අධිකරණමය යන්ත්‍රණයක් පිහිටුවීම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ප්‍රතිස්ථාපනය කිරීම, ආරක්ෂක හේතු මත රඳවා ගෙන සිටින අයට නඩු පැවරීම හෝ නිදහස් කිරීම, අධි සෝදිසි සංස්කෘතිය ඉවත් කිරීම, සුළු ජාතිකයන්ට වෙනස් ලෙස සැලකීම අවසන් කිරීම, තව තවත් ඉඩම් ආපසු ලබා දීම, මාධ්‍යවේදීන් හා සිවිල් සමාජය සඳහා වඩා විවෘත හා නිදහස් වතාවරණයක් ඇති කිරීම. ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම හා එක්සත් සාමකාමී හා සෞභාග්‍යාවත් ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම ආදිය සම්බන්ධයෙන් රජය කැප වී ඇති බව අපි දනිමු.

යුද්ධයේ අඳුරු පරිච්ඡේදය සදහටම වසා දමන්නට අපට අවශ්‍ය නම් එය ශ්‍රී ලංකා රජයට පමණක් කළ හැකි දෙයක් නොවේ. දැනට සිදු වෙමින් පවතින විවිධ සාකච්ඡාමය ක්‍රියාදාමයන්ට සහභාගි වීමෙන් සියලු ම ශ්‍රී ලාංකිකයන්ට මෙම ඓතිහාසික අවස්ථාවෙන් ප්‍රයෝජන ගත හැකියි. උදාහරණයක් වශයෙන් යෝජිත ප්‍රතිසන්ධාන හා වගවීමේ ක්‍රියාවලිය පිළිබඳව මහජන අදහස් ලබා ගැනීමට රට පුරා පැවැත්වෙන කාර්ය සාධන බලකායේ සාකච්ඡාවලට සහභාගීවීම, ඔබ සැම දෙනාටම ප්‍රයෝජනවත් වනු ඇත.

මිත්‍රවරුනි, ප්‍රතිසන්ධානය වූ එක්සත් ශ්‍රී ලංකාවක් පිළිබඳ ශ්‍රී ලංකා ජනයාගේත් ශ්‍රී ලංකා රජයේත් දැක්මට ආධාර කිරීමට එක්සත් ජනපදය සූදානම්ව සිටී. ජාතික ප්‍රතිසන්ධානය ක්‍රියාවට නංවන මෙම ස්වර්ණමය අවස්ථාවේ, අපි ශ්‍රී ලංකාවේ මිතුරා හා සහකරු ලෙස ඔබ අසලින් ම සිටිමු. ශක්තිමත්. එක්සත්, ප්‍රජාතන්ත්‍රීය හා සෞභාග්‍යාවත් ශ්‍රී ලංකාවක් පිළිබඳ දැක්මට මුළු ලෝකයේ ම ප්‍රශංසාව හිමි වේ. ආර්ථිකය නැවත ගොඩ නැගීමට, යහපාලනය ශක්තිමත් කිරීමට හා ජනවර්ගය, ආගම හෝ ලිංගිකත්වය ගැන තැකීමකින් තොර ව සියලු දෙනාට ම සමාන අයිතිවාසිකම්, සමාන අවස්ථා හා පශ්චාත් ගැටුම් සංවර්ධනයේ ප්‍රතිලාභ ලබා දීමට ඔබත්, ඔබේ රජයත් සමග අතිනත ගෙන කටයුතු කිරීමට අපි සූදානම් බව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි.

නෝනාවරුනි, මහත්වරුනි. මගේ කථාව අවසන් කිරීමට පෙර මෙහි පැමිණීම ගැනත්, මෙම අවස්ථාවට සහභාගී වීම ගැනත් ඔබ සියලු දෙනාට ම හෘදයාංගම ව ස්තුති කිරීමට මට අවසර දෙන්න.